පේබාලවයස් අයෙකු සමඟින්, ඔහුගේ හෝ ඇයගේ කැමැත්ත ඇතිව ලිංගික සබඳතාවයක් පැවැත්වූවද, එය වරදක් සහ ලිංගික අපරාධයක් ලෙසින් නීතිය හඳුනාගනී. මන්දයත්, බාලවයස් දරුවෙකු හෝ දැරියක එවැනි සබඳතාවයකට කැමැත්ත දීමට හැකි වයසක නොසිටින බැවිනි.

එබැවින්, බාලවයස්කරුවෙකුගේ කැමැත්ත ඇතිව සිදුවන ලිංගික සබඳතාවයක් පිළිබඳව වාර්තා කිරීමේදීද, මාධ්‍ය විසින් එය ලිංගික අපයෝජනයක් බව මූලිකවම හඳුනාගත යුතුයි.

කෙසේ නමුත්, එම ආචාර ධාර්මික ප්‍රවේශයෙන් පිට පනින මාධ්‍ය වාර්තාවන් ද දක්නට ලැබේ.

"අසැබි දසුන් නරඹා අට දෙනෙකු එක්ක 'සූත්‍රය' රඟපෑ අවු.14 කෙල්ල" යන සිරස්තලය සමඟින් දිවයින (දෙසැම්බර් 18, 2022) පුවත්පතේ පළ වී ඇති ලිපියක් ඊට නිදසුන් ලෙස ගත හැක.

එසේම, මෙම ලිපිය, ලිංගික අපරාධයකට ලක්ව ඇති බාලවයස් දැරිය වෙත සිදුවීම පිළිබඳව දෝෂාරෝපණය එල්ල කරනා ආකාරයකින්, හැඟීම් කළඹවන (භාවාතිශය) ස්වරයකින් ලියැවී ඇත.

ඔබ සිතන ලෙසට,

1) බාලවයස් ලිංගික අපයෝජනයන් මෙවැනි සිරස්තල ඔස්සේ සැහැල්ලු කොට දැක්වීමෙන්, බාලවයස් ලිංගික අපයෝජනයන් සාමාන්‍යකරණය වීමේ අවදානමක් නොමැති ද?

2) ලිංගිකත්වය වැනි කරුණු පිළිබඳව තීරණ ගැනීමට නොහැකි බාල වයසක සිටිනා දැරියකට, ඇය මුහුණ පෑ ලිංගික අපයෝජනයේ වරද පටවමින් ඒ පිළිබඳව වාර්තා කිරීම කෙතරම් වගකීම් සහගත ද? ඒ ඔස්සේ ද, බාලවයස් ලිංගික අපයෝජනයන් පිළිබඳව සැහැල්ලු අදහසක් සමාජගත නොවන්නේ ද?

3) මෙවැනි වාර්තාකරණයන්, වඩාත් විශාල සමාජ ගැටළුවකට මඟ පාදනු නැතැයි ඔබ සිතන්නේ ද?

මෙම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම **Priyadharshini Sivarajah** විසින් අපට යොමු කරන ලද්දකි.

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම

මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න.